

# අභාවයට ගිය රජගලතැන්න බෞද්ධ සිද්ධස්ථානය

දැනට නටබුන්ව දිරාපත් වී ඇති රජගලතැන්න විහාරය සෑම බෞද්ධයකුගේම සිත්සතන්හි පෙළඹීමක් ඇති කරනවාට කිසිදු සැකයක් නැත.

අම්පාර නගරයට සැතපුම් 16 පමණ උතුරෙන් බකි ඇල්ල ගම්මානයට මුහුණ ලා ඝන කැලෑවකින් වැසී ඇති පර්වතවක් මුදුනේ පිහිටා ඇති රජගල විහාරය අද නිශ්චලව වැළපෙන්නා සේ පෙනේ. ඈත අතීතයෙහි ගිරිකුඹුල විහාරය නමින් හැඳින් වුන මේ සිද්ධස්ථානය රුහුණ, රජරට රජදරුවන්ගේ ආස්වාදයක්, සහායක් ලද ආශ්‍රමයක් සේ ප්‍රසිද්ධියක් ලබා තිබුණි.



Stone block with Buddha statue, Rajagala

ඉන්දියාවේ ප්‍රබල මහා බොදු රජකු වූ ධර්මාශෝක රජුගේ පුත් මිහිඳු මාහිමියන් පොසොන් මස පුර පසළොස්වක දා මිහින්තලා පව්ව නම් වූ ගිරිකුල මස්තකයේදී එවක රජ කළ දෙවැනි පෑ තිස් මුවෙකු පසු පස ලුහු බඳිමින් සිටියදී, ඔහු ඒ ක්‍රියාවෙන් මුදවා, පංච සීලයෙහි පිහිටුවා, සිරිලක බුදු සසුන පිහිටුවීමට මුල්තැන ගත් සේක.

අනුබුදු මිහිඳු හිමිපාණන්ගේ පාද ස්පර්ශයෙන් අති පවිත්‍ර වූ නිසා දෝ පොසොන් පොහෝ දින මිහින්තලය වැඳ පුදා ගැනීමට ගලා යන බැතිමතුන්ගේ -සාදු, සාදු” රාවයෙන් ගුගුරු වන චංචල වන එම පෙදෙස බුද්ධා ලම්බන ප්‍රීතියෙන් යළි, යළි ශුද්ධ පවිත්‍ර වෙනවා දැක්ම සෑම සැදැහැවතුකුගේම ප්‍රීතියට කරුණක් වෙනවා නො-අනුමානය.

උත්තිය රජ දවසේ පිරිනිවන් පෑ මිහිඳු හිමියන්ගේ භෂ්මාවශේෂ විහාර ගණනාවකට බෙදා දුන් අතර රජගල විහාරයට ලැබුණු කොටස එම විහාර භූමියේ තැන්පත් කොට ඒ මත මහා ස්ථූපයක් ගොඩ නංවා ඇති බැව් මහාවංශයේ කියවේ.

අද දක්නා පරිදි මේ ස්ථූපය පමණක් නොව විහාරයද ගරා වැටී, වල්පත් වී යෑම ඒ අනුබුදු මිහිඳු හිමියන්ට කරනු ලබන අගෞරවයක්, අපකීර්තියක් සේ සැලකිය හැක. ඇත්තවශයෙන්ම, රජගල විහාරයද මිහින්තලා පූජ්‍ය ස්ථානය ගනයේම ලා සැළකිය යුතුව ඇත.

මේ භූමිය වැදි ජනයාගේ වාසස්ථානයක් හෝ ඔවුන් ගැවසුණු ස්ථානයක් බවට විහාර භූමියේ ඇති ගල් ලෙනක දැක්නට ලැබෙන සිතුවම් වලින් පැහැදිළි වේ. බුදු සසුන සීඝ්‍ර ලෙස ලක්දිව පැතිර යෑම නිසා මේ භූමිය ප්‍රබල පූජණීය ස්ථානයක් සේ පරිවර්තනය වෙන්න ඇති.

නමුත් කාලයාගේ ඇවෑමෙන් අභාවයට පත් මේ පූජණීය භූමිය සිත්ගන්නා සුළු පුරා විද්‍යාත්මක ලක්ෂණාවලින් හා අංග වලින් පිරිපුන් තැනක් සේ දැක්විය හැක.

විහාර භූමියේ නටබුන් අතර තිබෙන ගලින් කපා ඇති විශාල ගෝලාකාර ගැඹුරු පාත්‍රය දැකුම් කලු වස්තුවකි. මෙවැනි පාත්‍ර එකල භාවිතා කර ඇත්තේ මුල්වරට ලැබෙන පළතුරු අස්වැන්නෙන් පළතුරු මෙවැනි පාත්‍රවල බහා බුද්ධ පූජාවට යොදා ගැනිමයි.

මීට අමතරව සොයාගෙන ඇත්තේ අඩි 16 පමණ දිගැති ගලින් නෙළන ලද බුදු රූපයකි. නමුත් අවසර කර නැත. ගල් රූපය මත කෙටුම් කර ඇති සෘජුකෝණ රේඛාවලින් පෙන්නුම් කරන්නේ මේ රූපය එතෙක් ආධුනික මූර්ති ශිල්පීන් නෙළා ඇති බවක් ප්‍රධාන ශිල්පියා එය කුමන හේතුවක් නිසා දෝ අවසන් නොකර ඇති බවත්ය.



Dr. Mathu H. Liyanage
PhD in Creative Writing (Ireland)
Master of Letters in Creative Writing (Australia)
BA (Hons) in Philosophy (London)
Higher Diploma in Advanced Freelance Journalism (Australia)
Special Certificate in Advanced Social Work(Philippine Women's University)
Diploma in Social Work (Sri Lanka)

රජගල විහාරය පෙන්නුම් කරන චිත්‍ර කලාව, ලේඛන කලාව, කැටයම් කලාව, මූර්ති කලාව, වාරි මාර්ග තාක්ෂණ හා වාස්තු විද්‍යාව ආදී නොයෙකුත් අංශයන්ගෙන් විස්තර කැටි කර දක්වන ඓතිහාසික ස්ථානයක් සේ විදහා දැක්වීම අතිශෝක්තියක් නොවෙනවා ඇත.

රජගල විහාරස්ථානයේ ජීවත් වූ භික්ෂූන් වහන්සේලාගේ සුව පහසුකම් සඳහා කන්ද මුදුනේ පර්වත දෙකක් අතර වූ නිම්නයේ ඉදිකර ඇති කුඩා වැව එම වැඩකරුවන්ගේ නිර්මාණ ශක්තියක්, දක්ෂතාවයත් මනාව විදහාපායි.

එපමණක් නොව, ගම්බද වැවක ස්වරූපය ගෙනදෙන මේ සිගිති වැව ග්‍රීෂ්ම කාලයේ සිසිල ලබා දීමට හා සවස් කාලයේ මනහර සිත්ගන්නා සුළු දර්ශණයක් ඉදිරිපත් කිරීමට පොහොසත් වෙන්නට ඇත.



Stone Bowl, Rajagala

ස්වභාවික සෞන්දර්යයෙන් හෙබි පුරා විද්‍යාවට නෑකම් කියන, එසේම මෑත කාලයේදී පුරා විද්‍යා පරීක්ෂණවලට භාජනය වූ ඓතිහාසික, ඉපැරණි බෞද්ධ සිද්ධස්ථානයක් වන මෙම රජගලතැන්න පූජණීය භූමිභාගය ඉතිහාසයේ අමරණීය ස්ථානයක් නොවෙනවාට කවරෙකුට කිවහැකිද ? ■

ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ කේක් සැරසිලි උපදේශිකාවක්
වෙතින් මෙල්බර්න් නුවර ඔබටත් දැන් විශේෂ සේවාවක්



මංගල කේක්, උපන්දින කේක්, ෂෝට් ඊට්ස්
වර්ග ඇතුළු ඕනෑම උත්සව අවස්ථාවක් විමසන්න
ඉරෝෂා සේනානායක
Ph: 03 5996 4304
Mob: 0433 455 596








No. 08, Miralie Way, Cranbourne West